මාධ්‍ය නිවේදන අංක 13

මැතිවරණ කොමිෂන් සභාව

**2021.04.22 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

- පිළිගත් දේශපාලන පක්ෂ විසින් 2019 වර්ෂයට අදාළව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබා දිය යුතු විගණනය කරන ලද ගිණුම් වාර්තා නියමිත දින වකවානුවල දී ලබා දී නොමැති පිළිගත් දේශපාලන පක්ෂ 04 ක් මැතිවරණ කොමිෂන් සභාව වෙත කැඳවා ඒ පිළිබඳව සාකච්ඡා කරන ලද අතර දේශපාලන පක්ෂ 02 ක් එහි දී කරන ලද ඉල්ලීම අනුව එම වාර්තා ලබා දීම සඳහා සහන කාලයක් ලබා දීමටත් කොමිෂන් සභාව වෙත නොපැමිණි හා එම වාර්තා ඉදිරිපත් නොකළ දේශපාලන පක්ෂ 02 ක් පිළිබඳව අවසන් තීන්දුවක් මීළඟ කොමිෂන් සභා රැස්වීමේ දී ගැනීම.

- අභ්‍යන්තර අර්බුද හේතු කොට ගෙන කණ්ඩායම් කිහිපයක් මගින් හිමිකම් කියනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ සම්බන්ධව මැතිවරණ අවස්ථාවක දී අදාළ කණ්ඩායම් කැඳවා තොරතුරු විමර්ශනය කොට කොමිෂන් සභාවට පිළිගත හැකි පාර්ශ්වය එම පක්ෂයේ නිල ලත් කණ්ඩායම ලෙස පිළිගැනීමටත්, අභ්‍යන්තර අර්බුද විසඳා ගැනීමට අපොහොසත් වන පක්ෂ එම අර්බුද විසඳා ගන්නා තෙක් අක්‍රිය තත්ත්වයෙහිලා සැලකීමට හා එම පක්ෂ ඡන්ද විමසීම්වල දී නාම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පමණක් තාවකාලිකව පිළිගැනීමෙන් වැළකී සිටීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.04.23